# ජාතික ජන බලවේගය
# පක්ෂ ව්‍යවස්ථාව

(2021.12.20 වැනි දින ශ්‍රී ජයවර්ධනපුර, මොනාක් ඉම්පීරියල්සම්මන්ත්‍රණ ශාලාවේදී රැස්වූ ජාතික ජන බලවේගයේ නියෝජිත සමුළුව විසින් සංශෝධන සහිතව අනුමත කරන ලද ජාතික ජන බලවේගයේ නව ව්‍යවස්ථාව)

27/12/2021

ප්‍රධාන ලේකම්
ජාතික ජන බලවේගය
නො. 464/20, පන්නිපිටිය පාර,
පැලවත්ත, බත්තරමුල්ල.

# ජාතික ජන බලවේගය
# පක්ෂ ව්‍යවස්ථාව

## 1. පක්ෂ නාමය
ජාතික ජන බලවේගය

## 2. ලකුණ
මාලිමාව

ප්‍රධාන ලේකම්
ජාතික ජන බලවේගය
නො.464/20, පන්නිපිටිය පාර,
පැලවත්ත, බත්තරමුල්ල.
27/12/2021

## 3. අරමුණ
ශ්‍රී ලංකාවේ ඓතිහාසික සංස්කෘතික උරුමයන්, සාරධර්ම හා සංස්කෘතික හර පද්ධතීන් ආරක්ෂා කරමින් නොබෙදුනු ශ්‍රී ලංකාවක් තුළ ජාතිභේදයෙන් තොර, සැමට සම අවස්ථා සාක්ෂාත් කරන යුක්ති සහගත සාධාරණ පාලන තන්ත්‍රයක් ඇතිකරලීමටත් එතුළින් ස්වයංපෝෂිත ආර්ථිකයක් ගොඩනැංවීමටත් මං සැළසෙන ඒ වෙනුවෙන් ආර්ථික සංවර්ධනය, සමාජ සාධාරණත්වය, ප්‍රජාතන්ත්‍රවාදය, ජාතික සමගිය ගොඩනැගීම ප්‍රධානතම අරමුණු කරගත් ප්‍රගතිශීලී වැඩපිළිවෙලක් සඳහා ඇපකැප වූ දේශ සේවකයින් සේ ක්‍රියා කිරීම මෙම දේශපාලන පක්ෂයේ ප්‍රතිපත්තිය වන්නේය.

## 4.සාමාජිකත්වය
**(අ) සාමාජිකත්වය ලැබීමට සුදුසුකම්**

i. ශ්‍රී ලංකාවේ නිත්‍ය පදිංචිය ඇති හෝ විදේශගතව සිටිය ද ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය අත් නොහළ වයස අවුරුදු 16 පිරුණු, ජාතික ජන බලවේගයෙහි අරමුණු, ව්‍යවස්ථා මාලාව පිළිගන්නා, පක්ෂ සාමාජික මුදල් නොකඩවා ගෙවන්නට සූදානම් අය පක්ෂ සාමාජිකත්වය ලැබීමට සුදුසු වේ.

ii. ජාතික ජන බලවේගයේ ප්‍රතිපත්ති, අරමුණු හා ව්‍යවස්ථාව පිළිගන්නා වෙනත් දේශපාලන පක්ෂවලට හා සංවිධානවලට ජාතික ජන බලවේගයේ ජාතික විධායක සභාවේ අනුමැතියට යටත්ව ජාතික ජන බලවේගයට එක්විය හැක. එවිට එම පක්ෂය හා සංවිධානවල සාමාජික සාමාජිකාවන්ද ජාතික ජන බලවේගයේ සාමාජිකත්වය ලැබීමට සුදුසුසන් වෙති.

**(ආ) සාමාජිකත්ව ප්‍රභේද සහ සාමාජිකත්වය ලබාගන්නා පිළිවෙල**

සාමාජිකත්වය සාමාන්‍ය සාමාජිකත්වය සහ ක්‍රියාකාරී සාමාජිකත්වය වශයෙන් දෙ ආකාර වේ.

**i. සාමාන්‍ය සාමාජිකත්වය**

සාමාජිකත්වය ලබා ගැනීම සඳහා නියමිත සුදුසුකම් සපුරාලන ඕනෑම අයෙකු විසින් සාමාජිකත්ව අයදුම්පතක් සම්පූර්ණ කර ඇතුළත් වීමේ ගාස්තුව සහ එක් වර්ෂයක සාමාජික මුදල සමග පක්ෂයට භාර දීමෙන් සාමාන්‍ය සාමාජිකත්වය ලබාගත හැකිය.

**ii. ක්‍රියාකාරී සාමාජිකත්වය**

සාමාන්‍ය සාමාජිකත්වය ලබාගත් සහ පක්ෂයේ කටයුතුවලට සක්‍රිය ලෙස සහභාගි වීමට උනන්දුවක් දක්වන අය හට පක්ෂයේ ජාතික විධායක සභාවේ තීරණය අනුව ක්‍රියාකාරී සාමාජිකත්වය පිරිනමනු ලැබේ.

**(ඇ) සාමාජික ප්‍රතිඥාව**

පක්ෂයේ සාමාජිකත්වය ලබා ගන්නා සෑම කෙනෙකු ම පහත සඳහන් ප්‍රතිඥාවට අත්සන් තැබිය යුතුය.

"මම පක්ෂයේ අරමුණුවලට එකඟ වෙමි. පක්ෂ ව්‍යවස්ථාවට අනුකූල වෙමි. පක්ෂයේ අරමුණු සහ ඉලක්ක සපුරා ගැනීම සඳහා එහි තීරණයන් හා විධානයන් ක්‍රියාවට නගමි."

**(ඈ) සාමාජික මුදල්**

සාමාජිකයෙකු ලෙස බඳවා ගැනීමේදී ගෙවිය යුතු ඇතුළත් වීමේ ගාස්තුව රුපියල් පනහකි. (රු. 50/=)

එක් වර්ෂයක් සඳහා ගෙවිය යුතු සාමාජික මුදල රුපියල් සියයකි. (රු.100/=)

එහෙත් එම මුදල කාලානුරූපව සංශෝධනය කිරීමේ බලය ජාතික විධායක සභාව සතු වේ. මුල් වරට සාමාජික මුදල් ගෙවන්නන් හැර සෙසු සියලුම සාමාජිකයන් විසින් වාර්ෂික සාමාජික මුදල අදාල වසරේ පළමු කාර්තුවේ අවසාන දිනට පෙර ගෙවිය යුතුය.

**(ඉ) සාමාජිකයාගේ වගකීම**

i පක්ෂයේ ප්‍රතිපත්තිවලට, අරමුණුවලට අනුකූලව කටයුතු කිරීමද පක්ෂයේ තීරණ සහ විධානයන්ට අවනත වීම ද, පක්ෂයේ ගෞරවයට සහ කීර්තියට හානි පැමිණවීමෙන් වැළකීමද, පක්ෂ ව්‍යවස්ථාවට සහ පක්ෂ විනයට බැඳී සිටීමද සාමාජිකයාගේ වගකීම වේ.

ii. පක්ෂයේ සමගිය, සහයෝගීතාව හැම විටම රැකීම හා පක්ෂයේ විනය කඩ නොකිරීමද පක්ෂ සාමාජිකයාගේ වගකීම වේ.

27/12/2021

ප්‍රධාන ලේකම්
ජාතික ජන බලවේගය
නො.464/20, පන්නිපිටිය පාර,
පැලවත්ත, බත්තරමුල්ල.

**(ඊ) පක්ෂ සාමාජිකත්වය අවසන් වීම**

i පක්ෂයේ ජාතික විධායක සභාව වෙත සිදු කරනු ලබන ලිඛිත දැන්වීමක් මගින් පක්ෂ සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වීම හෝ විනය පරීක්ෂණයකින් අනතුරුව ජාතික විධායක සභාවේ තීරණයක් මගින් සාමාජිකත්වයෙන් නෙරපා හැරීම හෝ යන දෙ ආකාරයෙන් එක් ආකාරයකින් සාමාජිකත්වය අවසන් විය හැකිය.

ii. පක්ෂ සාමාජිකත්වය වාර්ෂිකව පිරික්සුමට ලක්කරනු ලැබේ. මෙහිදී සාධාරණ හේතුවකින් තොරව, කලක් පක්ෂ සංවිධානවල ක්‍රියාකාරී නොවූ හා/හෝ සාමාජික මුදල් නිසි ආකාරව නොගෙවූ සාමාජිකයන් පක්ෂය හැර ගිය අය සේ සලකා ඔවුන්ගේ සාමාජිකත්වය අහෝසි කරනු ලැබේ. එය සිදුකරනු ලබන්නේ පක්ෂයේ ජාතික විධායක සභාව විසිනි.

**(උ) වෙනත් සංවිධානයක සාමාජිකත්වය දැරීම**

i. පක්ෂයේ ප්‍රතිපත්ති සහ ක්‍රියාමාර්ගවලට පටහැනි සහ/හෝ පටහැනි විය හැකි කිසිදු දේශපාලන පක්ෂයක වෙනත් සංවිධානයක හෝ සාමාජිකත්වය ලබා ගැනීම සහ/හෝ දැරීම සාමාජිකයා විසින් නොකළ යුතු ය. එබඳු ක්‍රියාවක් සිදු කිරීම පක්ෂ සාමාජිකත්වයෙන් නෙරපා හැරීමට හේතුවකි.

ii. එහෙත්, ජාතික ජන බලවේගයේ ජාතික විධායක සභාවේ අවසරය සහිතව පක්ෂයේ ප්‍රතිපත්තිවලට හා ක්‍රියාමාර්ගවලට හානි නොවන වෙනත් පක්ෂයක හෝ සංවිධානයක සාමාජිකත්වය දැරීමට පක්ෂ සාමාජිකයාට අවසර තිබේ.

iii එසේම පක්ෂ ව්‍යවස්ථාවේ 4(අ)ii. වගන්තියට අනුව ජාතික ජන බලවේගයේ ජාතික විධායක සභාවේ අනුමැතිය සහිතව ජාතික ජන බලවේගය හා එක්ව සිටින වෙනත් පක්ෂ හා සංවිධානවල සාමාජික සාමාජිකකාවන්ට එම පක්ෂ හා සංවිධානවල සාමාජිකත්වය හා/හෝ නායකත්වය දරමින්ම ජාතික ජන බලවේගයේ සාමාජිකත්වය හා/හෝ නායකත්වය දැරිය හැක.

## 5. පක්ෂ ව්‍යුහය

පක්ෂ ව්‍යුහය පහත සඳහන් පරිදි වේ.

ප්‍රධාන ලේකම්
ජාතික ජන බලවේගය
නො.464/20, පන්නිපිටිය පාර,
පැලවත්ත, බත්තරමුල්ල.
27/12/2021

**1. (අ) ජාතික මහා සම්මේලනය**

ජාතික මහා සම්මේලනය උත්තරීතර වේ. අවම වශයෙන් පස් වසරකට වරක් ජාතික මහා සම්මේලනය කැඳවිය යුතු, එය කැඳවීමේ වගකීම ජාතික විධායක සභාව සතුය. ඉදිරි කාල සීමාව සඳහා ජාතික විධායක සභාව සහ පක්ෂ නායකයා පත් කිරීමද, පක්ෂයේ ප්‍රතිපත්ති තීරණය කිරීමද, මෙම

ව්‍යවස්ථාව සංශෝධනය කිරීමද ජාතික මහා සම්මේලනය විසින් සිදු කළ යුතු වේ. සාමාන්‍ය ජාතික මහා සම්මේලනයක් කැඳවීමට යටත් පිරිසෙයින් මසකට පෙර සම්මේලනය පවත්වනු ලබන දිනය, ස්ථානය සහ වේලාව ලියාපදිංචි තැපෑලෙන් හෝ විධිමත් පරිදි අතින් භාර දෙනු ලබන ලිපියක් මගින් සාමාජිකයන්ට දැනුම් දෙනු ලැබිය යුතු ය. ජාතික මහා සම්මේලනය වෙත ඉදිරිපත් කරන යෝජනා යටත් පිරිසෙයින් සති දෙකකට පෙර සාමාජිකත්වය විසින් ප්‍රධාන ලේකම් වෙත භාර දිය යුතු ය.

(ආ) දේශපාලනයේ විශේෂ අවස්ථාවල විශේෂ සමුළු හෝ නියෝජිත සමුළු කැඳවීමට පක්ෂයේ ජාතික විධායක සභාවට බලය තිබේ.

**ii. ජාතික විධායක සභාව**

ජාතික මහා සම්මේලන දෙකක් අතරතුර ඉහල ම බලය උසුලනු ලබන්නේ ජාතික විධායක සභාවයි. ඒ සඳහා සාමාජිකයන් පත් කිරීම ජාතික මහා සම්මේලනයේදී පක්ෂ සාමාජිකයන්ගේ ඡන්දයෙන් තෝරා පත්කර ගනු ලබයි.

**iii. පක්ෂ නායකයා**

පක්ෂ නායකයා තෝරා ගැනීම ජාතික මහා සම්මේලනය විසින් කරනු ලැබේ. සමුළු වාර දෙකක් අතර යම් හේතුවකින් පක්ෂ නායක තනතුර පුරප්පාඩු වුවහොත් ඊළඟ සමුළුවකදී අනුමත කර ගැනීමට යටත්ව ජාතික විධායක සභාවේ සාමාජික සාමාජිකාවන් අතුරෙන් වැඩ බලන නායකයෙක් පත්කර ගැනීම ජාතික විධායක සභාව විසින් කළ යුතුය.

**iv. පක්ෂ ලේකම්වරයා හා නිළධාරී මණ්ඩලය**

(අ).ජාතික සමුළුවෙන් පසු රැස්වන පක්ෂයේ ජාතික විධායක සභාව ඉදිරි කාලය සඳහා ප්‍රධාන ලේකම්වරයෙක්, භාණ්ඩාගාරික හා උප ලේකම්වරු දෙදෙනෙක් ජාතික විධායක සභාව නියෝජනය කරන අය අතුරෙන් පත්කරගත යුතුය.

(ආ). කිසියම් හේතුවක් නිසා ප්‍රධාන ලේකම් තනතුරේ පුරප්පාඩුවක් ඇතිවූ වහාම ජාතික විධායක සභාව විසින් නව ප්‍රධාන ලේකම්වරයෙකු ජාතික විධායක සභාව නියෝජනය කරන අය අතුරෙන් පත්කර ගත යුතුය.

(ඇ). පක්ෂයේ නිලධාරී මණ්ඩලය පහත සඳහන් තනතුරුවලින් සමන්විත වේ.

පක්ෂනායක

ප්‍රධාන ලේකම්

භාණ්ඩාගාරික

උප ලේකම්වරු දෙදෙනෙක්

27/12/21

ප්‍රධාන ලේකම්
ජාතික ජන බලවේගය
නො.464/20, පන්නිපිටිය පාර,
පැලවත්ත, බත්තරමුල්ල.

**v. ප්‍රාදේශීය සංවිධාන**

ප්‍රාදේශීය සංවිධාන 'ජාතික ජන බලවේගයේ දිස්ත්‍රික් සභා' 'ආසන සභා' සහ 'කොට්ඨාස සභා' හෝ 'ග්‍රාමීය සභා'වලින් සමන්විත වන්නේය.

**(අ) දිස්ත්‍රික් සභාව**

දිස්ත්‍රික්කය තුළ ඇති සියලු අසන සභා එක් වීමෙන් දිස්ත්‍රික් සභාව සමන්විත වන අතර එය වර්ෂයකට වරක් ප්‍රතිසංවිධානය විය යුතුය.

**(ආ) ආසන සභාව**

ආසනයේ සියලුම කොට්ඨාශ සභා හෝ ග්‍රාමීය සභා එකතුවෙන් ආසන සභාව සමන්විත වන අතර අඩු තරමින් වර්ෂයකට වරක් වත් ප්‍රතිසංවිධානය විය යුතුය.

**(ඇ) කොට්ඨාශ හෝ ග්‍රාමීය සභා**

ආසනයකින් එක් ග්‍රාමසේවා වසමකට හෝ පළාත් පාලන කොට්ඨාසයකට එක් සභාව බැගින් පිහිටුවා ගත හැකි අතර එය 'කොට්ඨාස සභාව' හෝ 'ග්‍රාමීය සභාව' ලෙස හැඳින්වේ. ආසන සභාවට හා දිස්ත්‍රික් සභාවට කරනු ලබන ලිඛිත දැනුම්දීමක් මගින් ඒවා ප්‍රතිසංවිධානය කරවා ගත හැකිය.

## 6. මහජන නියෝජිතයින්

i. ජාතික ජන බලවේගය රට තුළ පවත්වනු ලබන ජනාධිපතිවරණ, මහ මැතිවරණ, පළාත් සභා හා පළාත් පාලන මැතිවරණ සඳහා අවස්ථාවට අනුව තරඟ කරනු ලැබේ. එකී මහජන ආයතන සඳහා තරඟ කොට ජාතික ජන බලවේගයෙන් තේරී පත්වන හා පත්කරනු ලබන සියලු මහජන නියෝජිතවරුන් සහ වරියන් ඔවුන් වෙනත් කුමණ පක්ෂයක සාමාජිකත්වය දැරූවත් ජාතික ජන බලවේගයේ මහජන නියෝජිතයන් ලෙස සැලකේ.

ii. ජාතික ජන බලවේගයේ මහජන නියෝජිතයන් ලෙස තේරී පත්වන හා පත්කරනු ලබන සියලු දෙනා ජාතික ජන බලවේගයට වගකිව යුතු අතර ඔවුන් මෙහෙයවීම, ඔවුන් පිළිබඳ විනය ක්‍රියාමාර්ග ගැනීම ඇතුළු තීරණ ගැනීම ජාතික ජන බලවේගයේ ජාතික විධායක සභාව සතු අයිතියක් වේ.

ප්‍රධාන ලේකම්
ජාතික ජන බලවේගය
නො.464/20, පන්නිපිටිය පාර,
පැලවත්ත, බත්තරමුල්ල.
27/12/2021

## 7. මුදල් හා දේපළ කළමනාකරනය

i. පක්ෂයේ සියලුම මුදල් පාලනය ජාතික විධායක සභාව සතු වුවද ජාතික විධායක සභාවේ අනුමැතිය හා උපදෙස් මත මුදල් පරිහරණය කිරීමේ වගකීම භාණ්ඩාගාරිට පැවරේ.

ii. පක්ෂයේ ගිණුම් කටයුතු පවත්වාගෙන යාම හා සියලු චෙක්පත්වලට අත්සන් තැබීම භාණ්ඩාගාරික හා ප්‍රධාන ලේකම් විසින් කළ යුතුය.

iii. පක්ෂයේ නමින් පක්ෂ ජාතික විධායක සභාව තීරණය කරනු ලබන බැංකුවක ජංගම ගිණුමක් මගින් මුදල් ගනුදෙනු පවත්වාගෙන යා යුතුය. පක්ෂය වෙත ලැබෙන මුදල්වලින් ජාතික විධායක සභාව විසින් තීරණය කරනු ලබන සුළු අත්මුදල් ප්‍රමාණයට අතිරික්ත මුදල් සෑමවිටම බැංකු ගිණුමේ තැන්පත් කළ යුතුය.

iv. පක්ෂය වෙත ලැබෙන සෑම මුදලක් සඳහාම භාණ්ඩාගාරිකගේ අත්සන සහිත රිසිට්පතක් නිකුත් කළයුතුය.

v. මුදල් ලැබීම් හා සියලු වියදම් පිළිබඳ ලිපි ලේඛන හා වාර්තා සැකසීම හා පවත්වාගෙන යාම භාණ්ඩාගාරික විසින් කළ යුතුය.

vi. වාර්ෂික අයවැය වාර්තාව පක්ෂය හෝ මහා සම්මේලනය විසින් නම් කරන ලද විගණන නිලධාරියෙකු විසින් අනුමත කළ යුතුය.

## 8. පක්ෂ විනය

i. මෙම ව්‍යවස්ථාවේ අංක 04 වැනි අධිකාරියෙහි 'ඉ', 'ඊ' හා 'උ' වගන්තිවල දක්වා ඇති විනය නීති එකක් හෝ කිහිපයක් කඩකිරීම විනය විරෝධී ක්‍රියාවක් සේ සළකුණු ලබන්නේය. කිසියම් විනය විරෝධී ක්‍රියාවක් සම්බන්ධයෙන් පක්ෂ ජාතික විධායක සභාව විසින් පත් කරනු ලබන සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත විනය කමිටුවක් මගින් විනය පරීක්ෂණයක් පැවැත්විය යුතුය. කිසියම් සාමාජිකයෙකුට විරුද්ධව විනය පරීක්ෂණයක් පවත්වනු ලබන කාලසීමාව තුළ ඔහුගේ/ඇයගේ පක්ෂ සාමාජිකත්වය තහනම් කිරීමේ බලය ජාතික විධායක සභාව සතු වේ. එවැනි විනය කමිටුවක් විසින් ලබාදෙනු ලබන නිර්දේශයන් සැළකිල්ලට භාජනය කරමින් විනයානුකූල දඬුවම් පැමිණවීමේ බලය ජාතික විධායක සභාවට සතුය.

ii. කිසියම් විනය කඩ කිරීමක් සම්බන්ධයෙන් පහත සඳහන් විනයානුකූල දඬුවම් ජාතික විධායක සභාව විසින් පැමිණවිය හැකිය.

අ. අවවාද කිරීම

ආ. පක්ෂ සාමාජිකත්වය නෙමසකට නොවැඩි කාලයක් සඳහා තහනම් කිරීම

ඇ. පක්ෂ සාමාජිකත්වයෙන් නෙරපා හැරීම

iii. විනයානුකූල දඬුවමක් පනවනු ලැබූ සාමාජිකයෙකු හට එම දඬුවමට විරුද්ධව එකී දඬුවම පනවනු ලැබූ දින පටන් දින 10 ක කාලසීමාව තුළ ජාතික විධායක සභාව වෙත එම දඬුවමට විරුද්ධව ලිඛිත අභියාචනයක් ඉදිරිපත් කිරීමේ අයිතිය ඇත.

27/12/2021

ප්‍රධාන ලේකම්
ජාතික ජන බලවේගය
නො. 464/20, පන්නිපිටිය පාර,
පැලවත්ත, බත්තරමුල්ල.

(24) e

vi. අභියාචනය ලියාපදිංචි තැපෑලෙන් සහ අතින් ප්‍රධාන ලේකම්වරයා වෙත භාර දිය යුතුය. එබඳු අභියාචනයක් පිළිබඳ තීරණය කිරීමේ අයිතිය ජාතික විධායක සභාව සතුය.

## 9. සංශෝධන

මෙම ව්‍යවස්ථා මාලාව සංශෝධනය කිරීමේ පරම අයිතිය ජාතික මහ සම්මේලනය සතුය.

## 10. අර්ථකථනය

මෙම ව්‍යවස්ථා මාලාවෙහි සඳහන් නොවන කිසියම් කාරණයක් පිළිබඳව තීරණ ගැනීමේ සහ මෙම ව්‍යවස්ථා මාලවේ කිසියම් අපැහැදිලි විධිවිධානයක් ඇත්නම් ඒ සම්බන්ධයෙන් අර්ථකථනය කිරීමේ පූර්ණ බලය ජාතික විධායක සභාව සතුය.

27/12/2021

ප්‍රධාන ලේකම්
ජාතික ජන බලවේගය
නො.464/20, පන්නිපිටිය පාර,
පැලවත්ත, බත්තරමුල්ල.